## රෝග පැතිරීම

- බහුල වශයෙන් වෛරස් රෝග පැතිරෙන්නේ කුඩිත්තන් මගිනි. එනම් රෝගී ගසකින් යුෂ උරා බොනලද කුඩිත්තෙකු නිරෝගී ශාකයකට ගොස් යුෂ උරා බීමේදී එම ශාකයටද වෛරසය ඇතුල්වීම සිදුවේ. මෙලෙස රෝගය බෝ කිරීම කුඩිත්තන් හට ඉතා කෙටි කාල සීමාවක් තුළදී සිදුකළ හැකිය.
- කප්පාදු කිරීම සඳහා යොදා ගන්නා උපකරණ මගින් ද රෝගය පැතිරේ.
- රෝගී වැල්දොඩම් ශාකවලින් ගන්නා ලද අතු කැබලි සිටුවීම සහ බද්ධ කිරීමට යොදා ගැනීම මගින් ද රෝගය පැතිරීම සිදුවේ.
- බීජ මගින් මෙම වෛරස් රෝග පැතිරීම සිදු නොවේ.

## රෝග පාලනය

- වෛරස් රෝග වැළඳුනු විට රසායනික ද්‍රව්‍ය යෙදීමෙන් මර්ධනය කළ නොහැක.
- සැමවිටම සිටුවීම සඳහා නිරෝගී රෝපණ ද්‍රව්‍ය පමණක් යොදා ගන්න.
- මෙම වැල් මත කුඩිත්තන් ඒකරාශිව නොසිටින අතර වෙනත් ශාකවල විශාල වශයෙන් මොවුන් රැඳී සිටියි.
- කුඩිත්තන්ගේ අන්තර්ධාරක ශාක ලෙස ක්‍රියාකරන පොඩිසිඤ්ඤමරං, වතුපාළු හා ගැට කොළ වැනි වල් පැළෑටිද, ග්ලිරිසීඩියා වැනි ශාකද වගා ක්ෂේත්‍රය අවටින් ඉවත්කර දැමීම යෝග්‍යය.
- තවද රනිල හා පිපිඤ්ඤා කුලයට අයත් බෝග වර්ගද කුඩිත්තන්ට ධාරක ශාක වන නිසා කුඩා හෝ මහා පරිමාණ වැල්දොඩම් වගාවක් අවට එම බෝග සිටුවීමෙන් වැලකිය යුතුය.

- වැල්වල දිරිය වැඩිකර ගැනීම සඳහා මුල සිටම ක්‍රමානුකූලව පොහොර හා ජලය යෙදීම වැදගත් වේ.
- පළමු මාස 06 තුලදී සතියකට වරක්වත් වගා ක්ෂේත්‍රය පරීක්ෂාකර රෝගී වැල් තිබේනම් ගලවා පුළුස්සා දමන්න.
- කප්පාදු කිරීමේදී යොදා ගන්නා උපකරණ සැමවිටම පිරිසිදුකර භාවිතා කරන්න.
- වගා ක්ෂේත්‍රය හා ඒ අවට ප්‍රදේශය සෑම විටම වල් මර්ධනය කර පිරිසිදුව තබා ගන්න. මෙම වෛරස සඳහා "වැල්දොඩම් වර්ග" වලට අමතරව එම කුලයේ වෙනත් විශේෂ ද අන්තර් ධාරක ලෙස ක්‍රියා කරයි.
- සෑම විටම නව වගාවක් ආරම්භ කිරීමට ප්‍රථම වෛරස් රෝග සහිත පැරණි වගාවක් වේ නම් එය ගලවා ඉවත්කර දැමීම අනිවාර්ය වේ.

*එක් රෝගී සාම්පලයක් මස්තු තාක්ෂණයෙන් පරීක්ෂා කරවා ගැනීමට රු. 100/= ක මුදලක් අය කෙරේ.*

ඔබට වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානයට පැමිණ හෝ පහත ආකාරවලින් ඇමතීමෙන්ද ලබාගත හැකිය.

තාක්ෂණික තොරතුරු: ඩබ්.එම්. පෙම්ලා ජයරත්න
උපදෙස්: ආචාර්ය ඊ.එම්. දසනායක

පැළෑටි වෛරස් විශේෂඥ,
පැළෑටි වෛරස් හඳුනාගැනීමේ මධ්‍යස්ථානය,
ගබඩාවත්ත, හෝමාගම.
දුරකතන/ෆැක්ස්: 011-2895598
ඊමේල්: doapvic@gmail.com

Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya.
Printed by: AGRICULTURE PRESS, Gannoruwa.

අත් පත්‍රිකා අංක 11

# වැල්දොඩම්

# වගාවේ වෛරස් රෝග



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශණයකි.

*Passiflora edulis* (පැසිෆ්ලෝරා එඩියුලිස්) යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන වැල්දොඩම් ශාකය පැසිෆ්ලොරේසියේ (Passifloracea) කුලයට අයත්ය.

වැල්දොඩම් පලතුරක් වන අතර, ප්‍රධාන වශයෙන් යොදා ගන්නේ යුෂ නිෂ්පාදනයටය.

වසර මුළුල්ලේ හොඳින් පැතිරුණු වර්ෂාපතනයක් ඇති තෙත් කලාපීය ප්‍රදේශයන්හි ඉතා පහසුවෙන් වගාකළ හැකි බහු වාර්ෂික වැවිලි බෝගයක් ලෙස ද මෙය හඳුන්වාදිය හැකිය.

කළුතර, ගම්පහ, රත්නපුර, කොළඹ සහ කුරුණෑගල දිස්ත්‍රික්ක වල දැනට වැඩි වශයෙන් වැල්දොඩම් වගා කරයි. අනුරාධපුරය හා යාපනය වැනි වියළි කලාපීය ප්‍රදේශවල මෙම බෝගය වගාකළ හැක්කේ ජල සම්පාදන පහසුකම් යටතේ පමණි. ගාල්ල හා නුවරඑළිය වැනි දිස්ත්‍රික්ක වල ද පහසුවෙන් මෙම බෝගය වගාකළ හැකිය.

කුඩා ගෙවත්තක වුවද වැල්දොඩම් වැලක් සිටුවා ගැනීම පහසුය. එවිට වැටදිගේ වැලයාමට හෝ ගසකට වැල යාමට සැලැස්විය හැකිය.

විටමින් හා ඛණිජ ලවණ වලින් පොහොසත් මෙහි යුෂය රසවත් බීමකි. මෙයට අමතරව වැල්දොඩම් පත්‍ර ගුණදායක මැල්ලුමක් ලෙස ද ආහාරයට යොදා ගනී.

පොල් වගාවක් යටතේ අතුරු බෝගයක් ලෙස වැල්දොඩම් වගා කරයි නම් පොල් වගාවට වයස අවු 5 පමණ වනතුරු හා වයස අවු 25 න් පසුව වගාව සිදුකරන්න. රබර් වගාවක් යටතේ වැල්දොඩම් වගා කළ හැක්කේ රබර් ගසට වයස අවුරුදු 3 - 4 පමණ වනතුරු පමණි.

"කහ පැහැති ප්‍රභේදය", "දම් පැහැති ප්‍රභේදය", "රහංගල දෙමුහුම" හා "මානි" යන ප්‍රභේද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සිටුවීම සඳහා නිර්දේශකර ඇත.

"කහ පැහැති ප්‍රභේදය" හා "මානි" ප්‍රභේදය පහතරට තෙත් හා වියළි කලාප සඳහා නිර්දේශ කරන අතර "දම් පැහැති ප්‍රභේදය" මුහුදු මට්ටමේ සිට මීටර් 1000 ට වඩා උස් ප්‍රදේශවල වගා කිරීමට යෝග්‍යය.

"රහන්ගල දෙමුහුම් ප්‍රභේදය" නිර්දේශ කරන්නේ ද උඩරට ප්‍රදේශ සඳහාය.

වැල්දොඩම් වගාවට වැළඳෙන සමහර රෝග නිසා අස්වැන්නේ ගුණාත්මයට හා ප්‍රමාණයට බලපෑම් ඇති කරයි. එවැනි රෝග අතර "වැල්දොඩම් විචිත්‍ර වෛරස් රෝගය" ප්‍රධාන තැනක් ගනී. මෙය වගාවට විශාල වශයෙන් හානි පමුණුවන රෝගයක් වේ.

## වැල්දොඩම් විචිත්‍ර වෛරස් රෝගය

මෙම රෝගය වැළඳීමට "අර්තාපල් Y" කාණ්ඩයට අයත් වෛරස හේතුවන බව දැනට සොයා ගෙන ඇත.

මුල් අවස්ථාවේ රෝගයට පාත්‍ර වූ විට වැල්වල අස්වැන්න බෙහෙවින් අඩුවී යන අතර, ගෙඩිවල ගුණාත්මය ද අඩුවේ.

## රෝග ලක්ෂණ

- ප්‍රධාන රෝග ලක්ෂණය නම් වැල්දොඩම් ශාකයේ පත්‍ර අස්වාභාවික ලෙස විරූපි වීමයි.
- පත්‍ර හැකිලී කොඩවී යාම සිදුවේ.
- පත්‍රය මත කහ කොළ පැහැති විචිත්‍රයක් ඇතිවේ.
- වැල්වල වර්ධනය බාලවීම සිදුවේ.
- ගෙඩියේ පොත්ත විචිත්‍ර ලක්ෂණ පෙන්වන අතර කහ හෝ කොළ පැහැති තෙත් ස්වභාවයක් ගන්නා පුල්ලි ඇතිවේ.
- ගෙඩි කුඩාවීම සිදුවේ.



මෙයට අමතරව වැල්දොඩම් වගාවට වැළඳෙන වෛරස් රෝග අතර "වැල්දොඩම් මුදුපුල්ලි වෛරස් රෝගය" හා "කාෂ්ඨීය වෛරස් රෝගය" දැකිය හැකිවේ.

## වැල්දොඩම් මුදු පුල්ලි වෛරසයේ රෝග ලක්ෂණ

- "අර්තාපල් Y" කාණ්ඩයට අයත් වෛරසයක් නිසා මෙම රෝගය ඇතිවේ.
- පත්‍රවල විචිත්‍ර ලක්ෂණ ඇතිවන අතර පත්‍ර වර්ධනය දුර්වල වේ.
- මේරූ පත්‍රවල කහ පැහැති මුදුපුල්ලි හටගැනීම විශේෂ ලක්ෂණයකි.



## කාෂ්ඨීය වෛරස් රෝග ලක්ෂණ

- "පිපිඤ්ඤා විචිත්‍ර වෛරසය" නිසා වැල්දොඩම් වල කාෂ්ඨීය රෝග ලක්ෂණ ඇතිවේ.
- පළමුවෙන් ළපටි පත්‍රවල විචිත්‍ර ලක්ෂණ ඇතිවේ. පසුව අනෙක් කොටස් වලට ද පැතිරී යයි.
- පත්‍රවල ප්‍රමාණය අඩුවන අතර තරමක් දුරට පත්‍ර ඇඹරීමක් පෙන්නුම් කරයි.
- පසුව මුළු වැලේම වර්ධනය දුර්වල වී ගෙඩි අස්වැන්න ද අඩුවේ.
- ගෙඩි කුඩාවන අතර ගෙඩියේ පොත්ත ඝණකම් වීම විශේෂ ලක්ෂණයකි.



